## 142 – සමන් පිච්ච

සමන් පිච්ච සුදු අරලිය රෝස ඩේලියා
හිම්දිරි උදයේ පිණිපොද අතරින්
නෙළා ගෙනාවා ජේසු නෙළා ගෙනාවා
ඔබ පුදන්න ජේසු, නෙළා ගෙනාවා

රෝස මලේ පැහය ගෙනා ඔබෙ පහන් බවයි
සුදු අරලිය පෙති අරගත් මුදු මොළොක් බවයි
දෝතින් ගෙන මහද තුළට ළං කර ගතිමී
ඉන් පිබිදී දවස පුරා ඔබ ළඟ හිඳිමී

හිම්දිරියේ එන පිණිපොද ඔබයි සමිඳුනේ
ඉන් නැහැවෙන සිතිඳු පියලි මමයි සමිඳුනේ
දොරට වඩින ළා හිරු රැස් ඔබයි සමිඳුනේ
එළිය ලබන තිල් තණ මමයි සමිඳුනේ